



ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

காணிசீர்திருத்தஆணைக்குழு

Land Reform Commission

ඉඩම් අමාත්‍යාංශය

காணிஅமைச்சு

Ministry Of Lands

වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය

ஆண்டுறிக்ஜகமற்றும் குணக்குறிக்ஜக

Annual Performance Report

2016

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය

2016

අංක 475

කඩුවෙල පාර

බත්තරමුල්ල


ශ්‍රී ලංකාව

දුරකථන:0113520162

ෆැක්ස්: 0112878052

විද්‍යුත් තැපෑල: chairman@lrc.gov.lk

වෙබ්: www.lrc.gov.lk



සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සංවර්ධන අරමුණු හා ඉලක්ක ප්‍රශස්ත අයුරින් සාක්ෂාත් කරගැනීමට ඉවහල් වන ප්‍රබලතම සම්පත වන ඉඩම් සම්පත සුළුතරයක් විසින් භුක්ති විඳීම වෙනුවට මෙරටේ සැබෑම උරුමකරුවන් වන මහජනතාව වෙත පත්කිරීමේ අරමුණින් දිවංගත හෙක්ටර් කොඩ්බෑකඩුව මැතිතුමන් විසින් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවන ලදි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා දශක 05කට ආසන්න වන මේ අවස්ථාවේ තවදුරටත් නීතිමය බැඳීම් අවසන් කිරීම, ඉඩම්වල පදිංචිව සිටින ජනතාවට ඔප්පු ලබාදීම, පූජනීය ස්ථාන වලට ඔප්පු ලබා දීම, රාජ්‍ය ආයතන විසින් බුක්ති විඳින ඉඩම් නියමානුකූල කිරීම මෙන්ම පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රැකී රක්ෂා ප්‍රවර්ධනය කිරීම සහ රාජ්‍ය ආදායම් උත්පාදනය තුළින් දේශීය කෘෂි ආර්ථිකය ගොඩනැගීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ඵලදායිව යොදා ගැනීම මෙන්ම නීති විරෝධී ක්‍රම වලින් බැහැර කර ඇති ඉඩම් හඳුනාගෙන ඒවා නැවත පනතේ අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා යොදවා ගැනීම තවදුරටත් කල යුතුව ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යය ඉටු කිරීම සඳහා ගරු ඉඩම් අමාත්‍ය එස්.එම් චන්ද්‍රසේන මැතිතුමාගේ උපදෙස් මත කඩිනමින් ඉහත ගැටළුවලට අවශ්‍ය විසඳුම් ලබා දීමට අවශ්‍ය සැලසුම් මේ වන විටත් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව, 2016 වර්ෂයට අදාළ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

නීතීඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

පටුන

1. දළ විශ්ලේෂණය 1
   1.1 හැදින්වීම 1
   1.2 දැක්ම මෙහෙවර සහ අරමුණු 2
      1.2.1 දැක්ම 2
      1.2.2 මෙහෙවර 2
      1.2.3 අරමුණු 2
   1.3 කාර්යභාරය සහ සංවිධාන සැලැස්ම 2
      1.3.1 කාර්යයන් 3
      1.3.2 සංවිධාන සැලැස්ම 4
   1.4 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල 5
      1.4.1 ප්‍රධාන අංශයන් 5
      1.4.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල 5
2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව 5
   2.1 ආයතන ස්ථාපනය 5
   2.2 කොමිෂන් සභාවේ සංයුතිය 5
   2.3 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත් 5
3. ආංශික ප්‍රගතිය 6
   3.1 කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශය 6
      3.1.1 කාර්යය මණ්ඩල සංයුතිය 6
      3.1.2 ආයතනික කටයුතු 7
      3.1.3 භෞතික සම්පත් කළමනාකරණය 8
   3.2 ඉඩම් අංශය 9
      3.2.1 ඉඩම් පැවරීම් අංශය 9
      3.2.2 ඉඩම් උපරිම සීමා අංශය 9
      3.3.3 තක්සේරු හා වන්දි අංශය 9
   3.3 නීති අංශය 10
      3.3 නීති අංශයේ කාර්යභාරය 10
   3.4 මුදල් අංශය 11
      3.4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 11
      3.4.2 අවසන් ගිණුම් වාර්තා 12
   3.5 අභ්‍යන්තර විගණක අංශය 16
      3.5.1 විගණනය සඳහා බලය 16
      3.5.2 වසර තුල ඉටු කරන ලද රාජකාරී 16
   3.6 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල 17

ඇමුණුම

A. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව 18

1. දළ විශ්ලේෂණය

1.1 හැඳින්වීම

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ස්ථාපිත වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාවට වසර 45 ක පමණ ඉතිහාසයක් ඇත.

එම කාල පරිච්ඡේදය පුරා කොමිපත් සභාවේ කාර්යභාරය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ලැබී තිබූ විධිවිධාන හා රජය විසින් වරින්වර ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත මෙහෙය වන ලදී. ඉඩම් හිමියන්ගේ නීතිමය බැඳීම් ලබාදීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම, පවරාගත් ඉඩම් ඵලදායී ආයෝජන වලට යෙදවීම, කොමිපත් සභාවට ලැබිය යුතු ආදායම රැස්කිරීම හා ඉඩම් ආරක්ෂා කිරීම, සේවක මණ්ඩල පුහුණුව සහ සුභසාධනය මේ අතර ප්‍රධාන වේ.

වර්තමාන රජයේ අරමුණු හා ප්‍රතිපත්තිවලට අනුව ඉඩම් කැබලි වැඩි ප්‍රමාණයක් රටේ ජනතාව අතරේ බෙදාදීමේ වැඩපිළිවෙල යටතේ එකී කටයුතු සාර්ථක කර ගැනීම ඉලක්ක කර ගනිමින් කොමිපත් සභාවේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද, 2016 වසර තුළ ආයතනයේ සේවක සේවිකාවන්ගේ රැකියා සුරක්ෂිතතාවයක් ඇති කරමින් නව ජීවයක් ලබාදීමේ වැඩසටහනක් දියත් කිරීම ආරම්භ කිරීමටද කටයුතු සම්පාදනය වෙමින් පවතී.

2016 වසර තුළ ඉටුකිරීමට හඳුනාගත් ඉලක්ක සහ අරමුණු අතර පහත සඳහන් ඉලක්ක සහ අරමුණු සුවිශේෂීතාවයක් උසුලයි.

i. කොමිපත් සභාව සතු හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම.
ii. ඵලදායී නොවන ආයෝජන වලට පවරන ලද ඉඩම් ආපසු ලබා ගැනීම.
iii. ඉඩම් කැබලි ලක්ෂයක් බෙදාදීමේ වැඩපිළිවෙළ යටතේ කොමිපත් සභාව සතු බෙදාදිය හැකි ඉඩම් බෙදා දීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කිරීම මෙන්ම මෙතෙක් බෙදා තිබූ ඉඩම් සඳහා පදිංචිකරුවන් නියමානුකූල කර තිබූ වැඩසටහනට නව මුහුණුවරක් දී ජාතික කර්තව්‍යයක් ලෙස ඉඩම් ඔප්පු බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
iv. ආදායම් වැඩිකිරීමේ වැඩසටහන්
    a) රණවිරු සේවා අධිකාරිය
    b) රජය විසින් අත්කර ගත් ඉඩම් සඳහා වන්දි මුදල් ලබා ගැනීම
    c) රාජ්‍ය ආයතන වලට පවරන ලද ඉඩම් වෙනුවෙන් ආදායම් ලබා ගැනීම
    d) බදු පදනම මත පුද්ගලයන්ට පවරන ලද ඉඩම් සඳහා මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ බදු මුදල් අයකර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම
    e) කලුගල් බදුදීම හා ඊට අදාල ආදායම් රැස්කිරීම
    f) මැණික් ඉඩම් වලට අදාලව නව රෙගුලාසි පනවා ආදායම් රැස්කිරීම
    g) සිලිකා, ඩොලමයිට්, වැලි ආදි ඛනිජ ද්‍රව්‍ය ඇති ඉඩම් වලින් ආදායම් ලබා ගැනීම

ආයතනයේ මෙම ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කරගැනීමට ඉවහල් වූ ක්‍රමවේද ලෙස කළමනාකරණ හා කළමනාකරණ නොවන ශ්‍රේණිවල කාර්ය මණ්ඩල සඳහා ඔවුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප, වැඩි දියුණු කිරීමේ අරමුණින් පුහුණු වැඩ සටහන් පැවැත්වීම. එසේම ඔවුන්ගේ සුභ සාධනය ඉහළ නැංවීමට අවශ්‍ය විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට හා ඔවුන්ගේ-අභිප්‍රේරණය වර්ධනය වීමට ඉවහල්වන අයුරින් ප්‍රසාද දීමනා ලබා දීම, භෞතික සහ යටිතල පහසුකම් සැපයීම, එසේම යහපත් මානසික සෞඛ්‍යයක් පවත්වා ගැනීම උදෙසා ආධ්‍යාත්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනාදිය සුවිශේෂී වේ.

මේ තුළින් දිර්ඝ කාලයක් පුරා පැවතෙන මහජනයාගේ ඉඩම් ගැටළු සඳහා කඩිනම් විසඳුම් ලබා දීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව විසින් සිදු කරමින් පවති

මීට අමතරව ඵලදායී ආයෝජන හඳුනාගෙන ඒ සඳහා ඉඩම් ලබාදීමට ගරු ඇමතිතුමාගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් මත විශේෂඥ දැනුම ඇති උපදේශක කමිටුවක නිර්දේශ මත ක්‍රියා කිරීම ආරම්භ කිරීම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව වෙතින් පවරා ගත් ඉඩම් අතුරෙන් ගිලිහි ගොස් ඇති සම්පත්වලින් ආයතනයේ ප්‍රගතිය පමණක් නොව රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීමටද කටයුතු කර ඇත.

1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 දැක්ම

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම.

1.2.2 මෙහෙවර

ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ උපරිමයට වැඩි ඉඩම් ජාතියේ යහපත උදෙසා ඵලදායීතාවය ඉහළ නංවමින්ද භෞතික සම්පතෙහි අයිතිය සුරක්ෂිත කොට පාලනය කරමින්ද, ඉඩම් උපරිමය කාලානුරූපව බලාත්මක කරමින්ද, නියමානුකූලව වන්දි ගෙවීම හා ආර්ථික කටයුතුවල ආයෝජනය කරමින්ද, අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා භාවිතා කළ හැකි ඉඩම් සංචිතයක් පවත්වාගෙන යමින් ජාතික සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස දායකවීම.

1.2.3 අරමුණු

i. ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම.
   a) ප්‍රකාශිත එහෙත් හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම
   b) මහජනතාව වෙතින් ලැබෙන තොරතුරු අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව සතු ඉඩම් හඳුනා ගැනීම
   c) පැවරීම් කළද, එම කාර්යය ඉටු නොවන්නේ නම් එම ඉඩම් කොමිපත් සභාව සතු කර ගැනීම

ii. කොමිපත් සභාව වෙත පැවරුණු ඉඩම් පිළිබඳ,
   a) ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නිශ්චය හා නිතීමය බැඳීම් නිදහස් කිරීම
   b) උපරිමයට වැඩි ඉඩම් කොමිපත් සභාව වෙත පවරා ගැනීම
   c) පවරාගත් ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවීම
   d) ප්‍රකාශ කරන ලද එහෙත් ප්‍රකාශ නොවන අයගේ ඉඩම් ආපසු ලබාදීම යන කාර්යයන් කිරීම

iii. රටේ ආර්ථිකය සමාජ සංවර්ධනය උදෙසා රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා පනතේ ප්‍රතිපාදන අනුව පවරා ගනු ලැබූ ඉඩම් ඵලදායී ලෙස ආයෝජන කාර්යයන්හි යෙදවීම

iv. කොමිපත් සභාව සතු ඉඩම් වලින් ලැබිය යුතු ආදායම් රැස් කිරීම හා එයින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය ලබාදීම

1.3 කාර්යභාරය සහ සංවිධාන සැලැස්ම

1.3.1 කාර්යයන්

i. ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධානයන්ට අනුව පුද්ගලයකුට නබා ගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නිත්‍යනුකූල කිරීම.

ii. උපරිමයට වැඩි ඉඩම් හදුනාගෙන කොමිපත් සභාව සතු කර ගැනීම.

iii. පනත්වලින් ලැබී ඇති ප්‍රතිපාදන අනුව නීතිමය බැඳීම් නිදහස් කිරීම.

iv. කොමිපත් සභාව සතු කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් ප්‍රකාශකයින්ට වන්දි මුදල් ගෙවීම.

v. පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට කටයුතු කිරීම.

vi. ඉඩම් ලේඛණ යාවත්කාලීන කරමින් ක්ෂේත්‍රය හා සම්බන්ධ වී ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම.

a) ප්‍රකාශ කර ඇති නමුත් හදුනාගෙන නොමැති ඉඩම්

b) උපරිමයට වැඩි ප්‍රකාශ නොකරන ලද ඉඩම්

c) පවරා දී ඇති නමුත් ඵලදායී ආයෝජනයක් නොකරන ලද ඉඩම්

vii. රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීම.

a) ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම

b) කෘෂිකාර්මික ව්‍යාපෘති සහ වගා කටයුතු සඳහා ඉඩම් ලබාදීම.

c) කර්මාන්ත සඳහා ඉඩම් ලබාදීම.

viii. රටේ සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීම.

a) ඉඩම් නොමැති ජනතාවට නිවාස අරමුණු සඳහා ඉඩම් ලබාදීම.

b) රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත ගනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.

c) ආගමික සිද්ධස්ථාන සඳහා ඉඩම් ලබාදීම

d) ජනතාව වෙනුවෙන් පොදු කටයුතු සඳහා ඉඩම් ලබාදීම.

e) රාජ්‍ය ආයතන වෙනුවෙන් ඉඩම් ලබාදීම.

ix. ආදායම් රැස්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

a) භූමියේ ඇති සම්පත් වලින් ආදායම් රැස් කිරීම

b) බදු පදනම මත ඉඩම් පැවරුම් කර බදු ආදායම් රැස් කිරීම.

c) රාජ්‍ය. රාජ්‍ය නොවන හා පුද්ගලයින්ගේ ලැබිය යුතු මුදල් අය කර ගැනීම.

x. ආයතනයේ සංවිධාන ව්‍යුහය ව්‍යුහගත කිරීම.

a) පුහුණු හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ඇති කරලීම


b) විධිමත් රාජකාරී පැවරුමක් කිරීම

c) බලතල විමධ්‍යගත කරමින් රාජකාරී පැවරුමක් කිරීම

d) සාකච්ජා. වැඩමුළු. පුහුණුවීම් සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම.

xi. ආයතනයේ කාර්යක්ෂම හා ඵලදායිතාවයක් ඇති කරලීමට භෞතික සම්පත් සම්පාදනය හා අවශ්‍ය පහසුකම් සලසා ඇත

1.3.2 සංවිධාන සැලැස්ම



1.4 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

1.4.1 ප්‍රධාන අංශ

i. කළමණාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

ii. ඉඩම් අංශය

iii. මුදල් අංශය

iv. නීති අංශය

1.4.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව. දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්යාල 20කින් සමන්විත වේ.

2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

2.1 ආයතනය ස්ථාපනය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මගින් පිහිටුවා ඇත.

2.2 කොමිෂන් සභාවේ සංයුතිය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සංයුතිය මෙසේය.

i. ගරු විෂය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන - සභාපති

ii. ගරු විෂය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් -05

iii. නිල බලයෙන් පත්වන සාමාජිකයින් -03

කොමිෂන් සභාවේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේහිලා උපයෝගී කරගනු ලබනුයේ මෙම කොමිෂන් සභා මණ්ඩලය මගින් ගනු ලබන තීරණ හා අනුමැතියන් වන අතර, එක් එක් කාර්යයට කොමිෂන් සභා මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ. 1972 වර්ෂයේ සිට 2016.12.31 දින දක්වා කොමිෂන් සභා මණ්ඩල රැස්වීම් 686 ක් පවත්වා ඇත.

2.3 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්

i. 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත
ii. 1975 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iii. 1981 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iv. 1981 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
v. 1986 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
vi. 1986 අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත

අංක (i) හා (ii) පනත් අනුව, දේශීය ප්‍රකාශකයින්ගෙන්, රන් පවුම් සමාගම්වලින් හා රුපියල් සමාගම්වලින් ඉඩම් අක්කර 1,048,208 රූඩ් 2 පර්. 01 ක් ඉඩම් ප්‍රතිසංසක්රණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඉහත අංක (i) හා (ii) පනත් සම්බන්ධව,

i. සංශෝධනයන් - අංක iii හා vi පනත් වලින්ද
ii. විධිවිධානයන් - අංක iv. v හා vi පනත් වලින්ද සලසා ඇත.

3. ආංශික ප්‍රගතිය

3.1 කළමණාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

3.1.1 කාර්ය මණ්ඩල සංයුතිය

වගුව. 3.1: 2016 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ නොරතුරු

අනු අංකය	තනතුරු නාමය	අනුමත තනතුර සංඛ්‍යාව	ප්‍රවර්තන වර්ෂයෙන් සිටි සංඛ්‍යාව (2016)	අතිරික්තය / ඌණතාවය
1.	අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
2.	ලේකම් /අධ්‍යක්ෂ (පාලන)	01	01	-
3.	අධ්‍යක්ෂ (මුදල්)	01	01	-
4.	අධ්‍යක්ෂ (ඉඩම්)	01	00	(01)
5.	අධ්‍යක්ෂ (නීති)	01	00	(01)
6.	අභ්‍යන්තර විගණක	01	01	-
7.	සහකාර අධ්‍යක්ෂ (පාලන)	01	01	-
8.	සහකාර අධ්‍යක්ෂ (මුදල්)	02	02	-
9.	සහකාර අධ්‍යක්ෂ (නීති)	03	04	01
10	සහකාර අධ්‍යක්ෂ (විමර්ශන)	01	01	-
11	සහකාර අධ්‍යක්ෂ (කලාප)	20	16	(04)
12	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති)	01	01	-
13	සහකාර අධ්‍යක්ෂ (ඉඩම් උපරිම සීමා)	01	01	-
14	සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පැවරීම්)	01	01	-
15	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තක්සේරු හා වන්දි)	01	01	-
16	සහකාර අධ්‍යක්ෂ (මැණුම්)	01	01	-
17	ගිණුම් නිලධාරී	01	00	(01)
18	පරිපාලන නිලධාරී	01	00	(01)
19	තොරතුරු තාක්ෂණ නිලධාරී	01	01	-
20	පුද්ගලික සහකාර	01(පුද්ගලික වන සේ)	01	-
21	තක්සේරු නිලධාරී	03	-	(03)
22	මාණ්ඩලික සහකාර	23(පුද්ගලික වන සේ)	21	-
23	ගිණුම් නිලධාරී	05(පුද්ගලින වන සේ)	04	-
24	සැලසුම් ශිල්පී	02	-	(2)
25	ප්‍රවාහන සහකාර	01	01	-
26	කළමනාකරණ සහකාර	215	243	-
		40(පුද්ගලික වන සේ)		-
27	රියදුරු	17	18	01
28	කාර්යාල සහායක	44	44	-
	එකතුව	**392**	**366**	

3.1.2 ආයතනික කටයුතු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවේ 2015 වර්ෂය හා සසඳමින් මෙම වර්ෂයේ ආයතනික කටයුතු කාර්යසාධනය 3.2 වගුව මගින් ඉදිරිපත්කොට ඇත.

වගුව. 3.2: 2016 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු

අනු අංකය	විස්තර	පෙර වර්ෂය (2015)			ප්‍රවර්තන වර්ෂය (2016)		
		ලැබූ සංඛ්‍යාව	අනුමත කළ සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යාව	ලැබූ සංඛ්‍යාව	අනුමත කළ සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යාව
1.	සේවයට බඳවා ගැනීම්	10	10	-	05	05	-
2.	විභාග පැවැත්වීම්	-	-	-	-	-	-
3.	සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම්	03	03	-	02	02	-
4.	සේවය ස්ථීර කිරීම්	05	05	-	06	06	-
5.	උසස් කිරීම්	-	-	-	-	-	-
6.	වැටුප් වර්ධක ගෙවීම්	304	295	09	304	300	04
7.	සේවය දීර්ඝ කිරීම්	02	02	-	02	02	-
8.	බඳවා ගැනීමේ පරිපාටි සැකසීම	-	-	-	-	-	-
9.	සේවය හැර යෑම්	-	-	-	-	-	-
10.	වැඩ තහනම් කිරීම්	03	03	-	02	02	-
11.	නැවත සේවයේ පිහිටුවීම්	-	-	-	-	-	-
12.	විනය පරීක්ෂණ	04	04	-	03	03	-
13.	විදේශ නිවාඩු අනුමත කිරීම්	03	03	-	-	-	-
14.	පුහුණු කිරීම්	01	01	-	-	-	-
15.	අමාත්‍ය මණ්ඩල සංදේශ	-	-	-	-	-	-
16.	ඇප ආරම්භ කිරීම්	-	-	-	01	01	-
17.	ඇප නිදහස් කිරීම්	06	06	-	05	05	-
18.	ණය අනුමත කිරීම						
	I. දේපල	-	-	-	-	-	-
	II. වාහන	-	-	-	-	-	-
	III. වෙනත්	112	97	15	112	86	26

3.1.3 භෞතික සම්පත් කළමනාකරණය

3.3 වගුව මගින් 2016 වර්ෂයේ කොමිපත් සභාව වෙත භෞතික සම්පත් අත්පත් කරගැනීම සහ බැහැර කිරීම පිළිබඳ තොරතුරු දක්වා ඇත.

වගුව. 3.3 : භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳතොරතුරු

අනු අංකය	වත්කම් වර්ගය	වසර ආරම්භයේ පැවති තත්වය	වර්ෂය තුළ සිදු වූ වෙනස්කම්		වසර අවසානයේ පැවති තත්වය
			විකිණීම්	මිලදී ගැනීම්	
1.	කැබ් රථ	12	-	-	12
2.	මෝටර් රථ	02	-	-	02
3.	මයික්‍රෝ කයිරන් ජීප් රථ	01	-	-	01
4.	වෑන්	01	-	-	01
5.	මුදල් නෝට්ටු ගණනය කිරීමේ යන්ත්‍ර	01	-	-	01
6.	ඩුප්ලෝ යන්ත්‍ර	01	-	-	01
7.	ජායා පිටපත් යන්ත්‍ර	06	-	02	08
8.	පරිගණක	47	-	-	47
9.	පරිගණක ප්‍රින්ටර්ස්	31	-	-	31
10.	ලැප්ටොප් පරිගණක	01	-	02	03
11.	ෆැක්ස් යන්ත්‍ර	20	-	-	20
12.	යතුරු ලියන	03	-	-	03
13.	සේප්පු	10	-	-	10
14.	කැමරා	01	-	-	01
15.	රූපවාහිනී යන්ත්‍ර	01	-	-	01
16.	ශීතකරණ	01	-	-	01
17.	ශබ්ද විකාශන යන්ත්‍ර	01	-	-	01

3.2 ඉඩම් අංශය

3.2.1 ඉඩම් පැවරීම් අංශය

3.4 වගුව මගින් 2016 වර්ෂයේ ඉඩම් පැවරීම් අංශයේ කාර්යසාධනය පෙනනුම් කරනු ලබයි.

වගුව. 3.4: 2016 වර්ෂයේ ඉඩම් පැවරීම් අංශයේ කාර්යසාධනය

අනු අංකය	ව්‍යාපෘති	මූලික කාර්යය ආරම්භය	නිම කළ සංඛ්‍යාව
1.	ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා බදුදීම	10	10
2.	අනුමත කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීම(ව්‍යාපෘති කමිටු වෙත ඉදිරිපත් කිරීම)	27	27
3.	නිවාස අරමුණු හා ජීවනෝපාය සලසා ගැනීමේ අවශ්‍යතාවය මත ඉඩම් විකිණීම් හා බදුදීම්	6,000	1,783
4.	විවිධ රාජ්‍ය ආයතනවලට පොදු කටයුතු සඳහා ඉඩම් බදුදීම්/ විකිණීම්	14	14
5.	දැව සම්පත් ආශ්‍රිත ආර්ථික උපයෝජන (ව්‍යාපෘති ටෙන්ඩර් මගින් විකිණීම)	40	40
6.	ඛණිජ සම්පත් ආශ්‍රිත ආර්ථික ව්‍යාපෘති (වැලි. කළු ගල්. සිලිකා. මැණික්. ඩොලමයිට්)	07	07

3.2.2 ඉඩම් උපරිම සීමා අංශය

3.5 වගුව මගින් 2016 වර්ෂයේ ඉඩම් උපරිම සීමා අංශයේ කාර්යසාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව. 3.5: 2016 වර්ෂයේ ඉඩම් උපරිම සීමා අංශයේ කාර්යසාධනය

අනු අංකය	විස්තරය	ඉලක්කය	මූලික කාර්යය ආරම්භය	නිම වූ සංඛ්‍යාව
1.	19 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ඉඩම් ලබාදීම.	72	07	07
2.	14 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම	24	12	12
3.	22 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම	24	17	17
4.	ප්‍රකාශ නොවන අයගේ ඉඩම් නිදහස් කිරීම	12	06	06

3.3.3 තක්සේරු සහ වන්දි අංශය

3.6 වගුව මගින් 2016 වර්ෂයේ තක්සේරු සහ වන්දි අංශය අංශයේ කාර්යසාධනය පෙනනුම් කරනු ලබයි.

වගුව. 3.6: 2016 වර්ෂයේ තක්සේරු සහ වන්දි අංශයේ කාර්යසාධනය

අනු අංකය	විස්තරය	ප්‍රකාශකයින් ගණන	ගෙවූ මුදල (රු.)
1.	වන්දි ගෙවීම්/ පොළී ගෙවීම්	15	28,184.51
2.	ඉඩම් විකිණීම් හා බදු දීම් සඳහා තක්සේරු කැඳවීම්	55	-
3.	ප්‍රධාන තක්සේරු කරුගෙන් තක්සේරු කැඳවා වාර්තා කිරීම	71	2,440,042.00

3.3 නීති අංශය

3.7 වගුව මගින් 2016වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව විසින් මෙහෙයවනු ලැබූ නඩු කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි.

වගුව. 3.7: 2016 වර්ෂයේ නඩු කටයුතු පිළිබඳ සංඛ්‍යා දත්ත

අනු අංකය	විස්තරය	2015.12.31 දිනට පවතින නඩු	2016 වර්ෂය තුළ නිම වූ සමථයට පත් වූ නඩු	2016 වර්ෂය තුළ පවරන ලද නඩු සංඛ්‍යාව	2016.12.31 දිනට පැවැති නඩු සංඛ්‍යාව
1.	ශ්‍රේෂ්ඨාධිකරණය	28	04	08	32
2.	අභියාචනාධිකරණය	39	05	13	47
3.	මහාධිකරණය	11	-	01	12
4.	දිසා අධිකරණය	345	17	36	364
5.	මහේස්ත්‍රාත් අධිකරණය	56	-	13	69
6.	කම්කරු විනිශ්චය සභාව	02	-	-	02
7.	කම්කරු ආරවුල්	02	-	-	02
8.	මානව හිමිකම් කොමිපත් සභාව	03	-	04	07
9.	සිවිල් අධිකරණය	17	05	15	27
	එකතුව	**503**	**31**	**90**	**562**

3.4 මුල්‍ය අංශය

3.4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.
- සියලුම ගනුදෙනු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) නියෝජනය වේ.
- වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා නැවත වර්ගීකරණය කර ඇත.
- අවසාන ගිණුම් සකස් කිරීම සඳහා උපචිත ක්‍රමය භාවිතා කිරීම.

මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

- සියලුම දේපල, පිරියත සහ උපකරණ පිරිවැය අඩු සමුච්චිත ක්ෂයවීම් වලින් දක්වා ඇත.

ක්ෂයවීම් ප්‍රතිපත්තිය

- **අඩු කිරීමේ ශේෂ ක්‍රමය මත පදනම්ව වත්කම් ක්ෂය වේ.**
- **වර්ෂය තුළ මිලදී ගත් වත්කමක් මිලදී ගත් දිනයේ සිට ක්ෂය වේ.**
- **වත්කම් වර්ගීකරණය සහ ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ.**

වත්කම්	ක්ෂයවීම් අනුපාතය
❖ ගොඩනැගිලි	**10%**
❖ පරිගණක උපකරණ	**20%**
❖ ගෘහ භාණ්ඩ උපකරණ	**7.5%**
❖ මෝටර් වාහන	**20%**
❖ කාර්යාල උපකරණ	**10%**
❖ සුභසාධන උපකරණ	**10%**

පුනරාවර්තන වියදම් ප්‍රාධනීකරණය

- ❖ පවරා ඇති ඉඩමේ ප්‍රාග්ධන වටිනාකම ගෙවිය යුතු වන්දි මුදල මත පදනම් වූ වටිනාකම පමණක් නොව, පුනරාවර්තන වියදම්වලින් ප්‍රතිශතයක් ද ප්‍රාග්ධන අගයට එකතු වේ.
- ❖ ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියේ 54 වැනි වගන්තිය යටතේ පහත සඳහන් ප්‍රතිශත භාවිතා කරමින් ඉඩම්/අත්පත්වල ප්‍රාග්ධන වටිනාකම වැඩි කිරීමට කොමිෂන් සභාව පහත සඳහන් පුනරාවර්තන වියදම් අනුමත කර ඇත.

❖ නීති ගාස්තු	100%
❖ තක්සේරු ගාස්තු	100%
❖ මිණුම්කරණ ගාස්තු	100%
❖ පරිවර්තන ගාස්තු	100%
❖ ප්‍රචාරණ ගාස්තු	100%

- මෙය1990/02/08 දින අංක 2918 සහ අංක 2959 දරන කොමිෂන් සභා පත්‍රිකා මඟින් හා අනුමත කරන ලදී.

3.4.2 පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන

අඛණ්ඩව වසර පහක් හෝ වසර පහකට වැඩි කාලයක් තම සේවය සම්පූර්ණ කළ සේවකයින් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන සලසා ඇත.

පාරිතෝෂිත ප්‍රතිපාදන = මූලික වැටුප * (සේවා වසර ගණන * 1/2)

අවසන් ගිණුම් වාර්තා

වගුව .3.8: 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

විස්තරය	සටහන්	31.12.2016 රු.	31.12.2015 රු.
ආදායම	1	390,292,853.98	248,206,406.34
වෙනත් මෙහෙයුම් ආදායම්	2	107,713,847.37	65,692,293.96
මූළු ආදායම		**498,006,701.35**	**313,898,700.30**
පරිපාලන වියදම්	3	267,695,824.97	233,639,440.07
සැපයුම් සහ අවශ්‍ය වියදම්	4	9,728,301.16	9,588,476.91
අනෙකුත් මෙහෙයුම් වියදම්	5	93,714,005.57	10,033,323.10
මුල්‍ය වියදම්	6	6,425,868.24	4,929,010.27
මූළු වියදම්		**377,563,999.94**	**258,190,250.35**
මෙහෙයුම් අතිරික්තය		120,442,701.41	55,708,449.95
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		**120,442,701.41**	**55,708,449.95**
2016.01.01දිනට ආරම්භක ශුද්ධ අතිරික්තය		902,430,781.83	833,056,330.43
පෙර වර්ෂය සඳහා ගැලපීම්		19,877,042.49	13,666,001.45
2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ අදායම		**1,042,750,525.73**	**902,430,781.83**

.....

එස්.පී.එස්.සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

.....

නීතිඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

.....

එච්.එම්.බී.පී.හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

වගුව. 3.9: 20161231 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳප්‍රකාශය			
	සටහන්	2016 රු.	2015 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල්, මුදල් හා සමාන දෑ	7	97,181,625.95	55,909,162.43
ලැබිය යුතු පොලී	8	38,643,293.96	22,120,214.97
ලැබිය යුතු අදායම්		-	29,731,610.01
වෙලඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	9	2,296,128,340.12	2,228,040,841.11
තැම්පතු හා අත්තිකාරම්	10	65,554,295.82	61,273,578.75
ඉඩම්		676,169,345.33	676,169,345.33
තොග - ලිපි ද්‍රව්‍ය	11	3,182,913.47	2,711,069.50
මුළු ජංගම නොවන වත්කම්			
ආයෝජන	12	1,369,328,834.82	1,233,664,542.00
දේපල, පිරියත හා උපකරණ	13	44,440,479.63	39,359,200.91
ලිදුල බංගලාව		1,003,646.00	641,118.00
ෆාම්ගාඩන් වත්ත		457,492.50	228,746.50
දවුල්කුරුඳුවත්ත		7,000.00	-
මුළු වත්කම්		**4,592,097,267.60**	**4,349,849,429.51**
වගකීම්			
ජංගම වගකීම්			
වෙලඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	14	108,936,533.60	105,360,955.55
කල්බදු ණයහිමි	15	-	3,809,025.89
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	16	79,618,116.01	61,569,030.00
වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර I		112,484,944.63	113,053,465.06
වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර II		109,959,492.95	109,959,492.95
මුළු වගකීම්			
ශුද්ධ වත්කම්			
වත්කම් සහ ස්කන්ධ ශුද්ධ වටිනාකම			
රජයේ දායකත්වය හා භාන්ඩාගාර ප්‍රධාන	17	1,964,075,000.00	1,964,075,000.00
සංචිත	18	1,174,272,654.68	1,089,591,678.23
සමුච්චිත අතිරික්තය		1,042,750,525.73	902,430,781.83
මුළු වගකීම් සහ ස්කන්ධය		**4,592,097,267.60**	**4,349,849,429.51**

වගුව. 3.10: 2016.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය			
විස්තරය	සටහන්	**31.12.2016** රු.	**31.12.2015** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් අතිරික්තය		126,868,569.65	60,637,460.22
ක්ෂය කිරීම්		7,430,583.49	8,171,857.89
මුල්‍ය වියදම්		(6,425,868.24)	(4,929,010.27)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය		**127,873,284.90**	**63,880,307.84**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
වෙලඳ හා වෙනත් ගෙවිය යුතු දෑ අඩුවීම හෝ වැඩිවීම		3,575,578.05	4,809,055.98
තැන්පතු හා අත්තිකාරම් අඩුවීම හෝ වැඩිවීම		(4,280,717.07)	517,272.10
කල්බදු ණයහිමි අඩුවීම හෝ වැඩිවීම		(3,809,025.89)	-
ලැබිය යුතුපොළී අඩුවීම හෝ වැඩිවීම		(16,523,078.99)	(1,410,742.71)
වෙලඳ සහ වෙනත් ලැබිය යුතු අඩුවීම හෝ වැඩිවීම		(68,087,499.01)	(6,141.00)
තොග අඩුවීම හෝ වැඩිවීම		(471,843.97)	(536,466.50)
ලැබිය යුතු අදායම් අඩුවීම හෝ වැඩිවීම		29,731,610.01	
වන්දි ගෙවීම් අඩුවීම හෝ වැඩිවීම		(568,520.43)	(222,657.60)
පාරිතෝෂික ගෙවීම් අඩුවීම හෝ වැඩිවීම		18,049,086.01	3,437,254.50
සමුච්චිත ක්ෂය ගැළපීම		(786,034.00)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**(43,170,445.29)**	**70,467,882.61**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
දෙපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම		(11,725,828.21)	(1,300,038.50)
ස්ථාවර තැනපතු ආයෝජන		(135,664,292.82)	(196,698,534.23)
ලිදුල බංගලාව		(362,528.00)	(278,590.00)
ෆාම්ගාඩන් වත්ත		(228,746.00)	-
දවුල්කුරුදු වත්ත		(7,000.00)	-
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**(147,988,395.03)**	**(198,277,162.73)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
ඉඩම් විකුණුම් ශු. වටිනාකම		84,680,976.45	85,399,655.63
කල්බදු		-	(6,756,217.35)
පෙර වසරේ ගැලපීම්		19,877,042.49	13,666,001.45
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**104,558,018.94**	**92,309,439.73**
මුදල් හා මුදල් සමාන දෑ හි ශු. වෙනස්වීම		**41,272,463.52**	**(35,499,840.39)**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		**55,909,162.43**	**91,409,002.82**
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**97,181,625.95**	**55,909,162.43**

වගුව. 3.1.1: 2016.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය					
විස්තරය	රජයේදායකත්වය රු.	භාණ්ඩාගාර ප්‍රධාන රු.	සමුච්චිත අතිරික්තය රු.	ප්‍රාග්ධන සංචිත රු.	එකතුව රු.
2016.01.01 දිනට ආරම්භක ශේෂය	15,000,000.00	1,949,075,000.00	902,430,781.83	1,089,591,678.23	3,956,097,460.06
ඉඩම් විකුණුම් ශු. වටිනාකම (40%)				84,680,976.45	84,680,976.45
පෙර වර්ෂය සඳහා ගැලපීම්			19,877,042.49		19,877,042.49
වර්ෂය සඳහා අතිරික්තය			120,442,701.41		120,442,701.41
2016.12.31 දිනට ශේෂය	**15,000,000.00**	**1,949,075,000.00**	**1,042,750,525.73**	**1,174,272,654.68**	**4,040,778,436.51**

3.5 අභ්‍යන්තර විගණන අංශය

3.5.1 විගණනය සඳහා බලය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභා පනත හා 1971 අංක 38 දරණ මුදල් පනත අනුව සැකසුන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභා මුදල් සංග්‍රහයේ 11 වන කොටසේ 2 වන වගන්තියේ අනු වගන්ති 01 - 03 අනුව විගණන සඳහා බලය ලැබී ඇත.

3.5.2 වසර තුළ ඉටු කරන ලද රාජකාරි

1. කොමිපත් සභාව සතු භූමියේ හිමිකම තහවුරු කර විවිධ ආයතන හා පුද්ගලයන්ට විකිණීම් හා බදු දීම් කරන ලද ඉඩම් ප්‍රතිපත්තිය යටතේ 2016 වසරට අදාළව මුදල් අය කර ගැනීමට නොරතුරු අනාවරණය කර වාර්තා කිරීම හා ලෙජර් විධිමත් කිරීමට පියවර ගැනීම.

2. කොමිපත් සභාවට 1972 අංක 01 දරණ පනත යටතේ පැවරුන කෘෂිකාර්මික ඉඩම් සඳහා ප්‍රකාශකයින්ට වන්දි ගෙවීම සඳහා ලිපි ගොනු 14 ක්ද එම පොළී ගෙවීම් ලිපි ගොනු 06 ක්ද පූර්ව විගණනයට ලක් කර ගෙවීම් සඳහා යොමු කිරීම.

3. දිස්ත්‍රික් බල මණ්ඩලවල මූල්‍ය තත්ත්වයන් ඇගයීමට ලක් කර ඒවායේ කටයුතු විධිමත් කිරීම හා ප්‍රවර්ධනය කළ යුතු ආකාරය සම්බන්ධව වාර්තා කිරීම.

4. විගණකාධිපති විසින් යොමු කරන ලද විමසුම් වලට අදාළව පිළිතුරු යැවීම පිණිස නිරීක්ෂණ 14 ක් ඉදිරිපත් කිරීම.

3.6 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

සභාව දිවයින පුරා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් පැතිරී පවතින දිස්ත්‍රික් කාර්යාල 20 කින් සමන්විත වේ. මෙම දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල කාර්යාල විසින් පහත කටයුතු සිදුකරනු ලබයි.

1. බස්නාහිර පළාත	කොළඹ	සෙන්ට්‍රල් ෆාමසි ගොඩනැගිල්ල. පාදුක්ක
	කළුතර	අංක 220. පරණ පාර. කළුතර
	ගම්පහ	ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ගොඩනැගිල්ල. කච්චේරිය. ගම්පහ
2. දකුණු පළාත	ගාල්ල	අංක. 27. රිච්මන්ඩ්කන්ද පාර. කළුවැල්ල. ගාල්ල
	මාතර	අංක 17/ජී. ධර්මරත්න පාර. උයන්වත්ත. මාතර
	තංගල්ල	උසාවිය පාර. තංගල්ල
3. ඌව පළාත	මොණරාගල	ජනසවි ගොඩනැගිල්ල. කච්චේරි හංදිය.
	මොණරාගල බදුල්ල	අංක 195. කැප්පෙටිපොළ පාර. බදුල්ල
4. නැගෙනහිර පළාත	අම්පාර	කච්චේරිය. අම්පාර
	මඩකලපුව	කච්චේරිය. මඩකලපුව

5. උතුරුපළාත	යාපනය	කච්චේරිය, යාපනය
6. උතුරු මැද පළාත	අනුරාධපුර	කච්චේරිය, අනුරාධපුර
7. සබරගමුව පළාත	රත්නපුර	ෆාම් ගාඩින් වත්ත, නව නගරය, රත්නපුර
	ඇඹිලිපිටිය ඇඹිලිපිටිය	12 බී, නොග ගබඩාව පාර, නව නගරය,
	කෑගල්ල	කච්චේරිය, කෑගල්ල
8. වයඹ පළාත	පුත්තලම	පම්බල, කාකපල්ලිය, මාදම්පේ
	කුරුණෑගල	අංක 16, උතුරු වැව පාර, කුරුණෑගල
9. මධ්‍යම පළාත	නුවරඑළිය නුවරඑළිය	I.R.D.P ගොඩනැගිල්ල, උඩුපුස්සැල්ලාව පාර,
	මහනුවර	සිව්වන මහල, නව දිසත්‍රික් ලේකම් කාර්යාලය,මහ නුවර
	මාතලේ	කච්චේරිය, මාතලේ

- දිස්ත්‍රික් කාර්යාල පරිපාලනය හා අධීක්ෂණ කටයුතු.
- අමාත්‍යාංශය හා ප්‍රධාන කාර්යාලයේ පැවැත්වෙන සාකච්ජා හා සම්මන්ත්‍රණ වලට සහභාගි වීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව වෙනුවෙන් දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ජංගම සේවා වලට සහභාගි වීම
- කට්ටිකරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණ පැවැත්වීම
- රජයේ අවශ්‍යතාවය සඳහා ආයතන වලට හා පුද්ගලික ආයතන වලට ඉඩම් ලබා දීම.
- දිස්ත්‍රික් ඉඩම් ලේඛණය සැකසීම යාවත්කාලීන කිරීම හා ඊට අදාළ රාජකාරි කටයුතු
- දිස්ත්‍රික්කයේ ඉඩම් ලේඛණය, බැහැර කළ ඉඩම් ලේණනය හා අනවසර ලේඛණය යාවත්කාලීන කිරීම.
- මාසිකව භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා සකස් කර ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ විගණන විමසීම් හා ලිපි සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය සමග සාකච්ජාකර ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ ඉඩම් නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- නොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ඊට අදාළ නොරතුරු, ප්‍රධාන කාර්යාලයේ නොරතුරු නිලධාරීවෙත නියමිත කාලයේදී ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන ඔප්පු ලබා දීමේ උත්සව සංවිධානය කිරීම.
- පවරාගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට අදාළ කටයුතු
- රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම සම්බන්ධීකරණය හා පසු විපරම් කටයුතු.
- විධිමත් පරිදි අත්පත් කර නොගත් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- බෙදා දීමට සුදුසු ඉඩම් කොටස් මැණුම් කිරීම සඳහා පෙන්වා දී මිනින්දෝරුවන්ට සහය වීම.

ඇමුණුම්

A. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ **2016** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව **1971** අංක **38** දරන මුදල් පනතේ **14(2)(සී)** වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒජීඑල්/ඒ/එල්ආර්සි/01/2016/23

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 මැයි 30 දින

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
02 JUN 2017
සභාපති අංශය

සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

පිටපත් :
1. ලේකම් - ඉඩම් අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No.	ඒජීඑල්/ඒ/එල්ආර්සී/ 01/2016/23	මගෙ අංකය உமது இல. Your No.	දිනය திகதி Date	2017 මැයි 30 දින

සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 56 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2017 අප්‍රේල් 05 දින නිකුත් කරන ලදි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් නිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

(i) මූල්‍ය ප්‍රකාශනවල ගනුදෙනු හා සිද්ධීන් වාර්තා කිරීමේදී උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු වුවත් දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබෙන ආදායම්, මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08

(i) ඉඩමක අයිතිය ලබා ගැනීම සඳහා කොමිෂන් සභාවට එරෙහිව පවරන ලද නඩුවක පැමිණිලිකරුවන්ට රු.148,715,363 ක් ගෙවීමට 2009 වර්ෂයේදී අභියාචනාධිකරණය තීන්දුවක් ලබා දී තිබුණි. එදින සිට අදාල පොළියද සමඟ ගෙවිය යුතු මුදල රු. මිලියන 200 ද ඉක්මවා තිබුණද එය ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගෙන ඒ සඳහා හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ii) 58 වගන්තිය අනුව බැඳීමක් පියවීම පිණිස අවශ්‍ය අගයට බලපෑම් ඇතිවිය හැකි අනාගත සිදුවීම් ඒවා ඇති බවට ප්‍රමාණවත් අරමුණුගත සාක්ෂි පවතින විටෙක ප්‍රතිපාදන අගයෙහි පිළිබිඹු විය යුතුය. එසේ වුවද කොමිෂන් සභාවේ සේවකයින් සඳහා 2006 - 2013 කාලය දක්වා දීමනාවට අදාලව ගෙවිය යුතු රු. 32,763,795 ක සේවක අර්ථ සාධක අරමුදල් සහ ඒ සඳහා අධිභාර ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බදු කුලී ගෙවීමේ ප්‍රමාදය මත අයවිය යුතු අධිභාර රු. 1,417,607 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු බදු කුලී, බනිජ සම්පත් වලින් අයවිය යුතු ආදායම්, අයවිය යුතු පරිහරණ ගාස්තු හා අයවිය යුතු ප්‍රවේණි ගාස්තු පිළිවෙලින් රු.63,403,562, රු.205,143,151, රු.26,661,071 හා රු.1,079,043 ක් ලෙස එකතුව රු.296,286,827 ක් ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතු කොටගෙන එම ප්‍රමාණයෙන් ආදායම් සහ වත්කම් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී ජ'නල් සටහනක් මඟින් සිදු කරන ලද වැරදි නිවැරදි කිරීමක් 2016 වර්ෂයේදී නැවතත් ගැලපීම හේතුවෙන් පරිගණක සහ උපාංග ක්ෂය වෙන්කිරීමේ ගිණුම රු. 786,034 ක් අඩුවෙන්ද පෙර වර්ෂ ගැලපුම් ගිණුම් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඈ) බදු ඉඩම් සම්බන්ධයෙන් කලින් ලද බදු කුලී වලින් 2016 වර්ෂයට අදාල රු.6,858,292 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත විය යුතු වුවත් සමුච්චිත අතිරික්තයට ගලපා තිබුණි.

(ඉ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ගෙවීමට සිදු වූ රු. 1,923,334 ක අධිභාරයෙන් රු.962.194 ක මුදලක් විශ්‍රාම පාරිතෝෂික වියදම් යටතේද ඉතිරි රු.961,140 ක මුදල සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ වියදම් යටතේද ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව අධිභාරය ලෙස ගෙවූ මුදල අධිභාරයක් ලෙස ගිණුම්ගත වී නොතිබුණි.

2.2.2 (ඉ)

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් ලෙස දක්වන රු.676,169,345 ක වටිනාකම, 1978 වර්ෂයේ මුල් වරට ගණනය කරනු ලැබූ ඉඩම් වටිනාකමට 2003 සහ 2006 වසරේදී කරනු ලැබූ සුළු ගැලපුමක් හැරුණු කොට 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම වෙනසක් නොවී එකම වටිනාකමක් ලෙස දක්වා තිබුණි. මේ අනුව වර්ෂයක් පාසා සිදු කෙරෙන අත්පත් කර ගැනීම්, විකුණුම් ආදිය ගැලපීමෙන් නිවැරදි වටිනාකම නිරූපනය කර නොතිබුණි.

2.2.4

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වන්දි අවිනිශ්චිත 1 සහ 2 අදියර යටතේ සමස්ත වගකීම රු.222,444,438 ක් වුවද තක්සේරු හා වන්දි අංශයේ වාර්තා අනුව ප්‍රකාශකයින් වෙත ගෙවීමට තිබූ වන්දි මුදල් පොලී මුදල් සහිතව රු.585,800,000 ක් විය. ඒ අනුව රු.363,355,562 ක වෙනසක් නිරීක්ෂණය වූයෙන් මෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 (අ)

(ආ) ආදායම් අංශයේ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බදු කුලී ආදායම රු. 185,995,884 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු. 152,725,231 ක් ලෙස දැක්වීමෙන් බදු කුලී ආදායමේ රු. 33,270,653 ක වෙනසක් විය.

2.2.2 (ආ).

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අත්තිකාරම්, අත්තිකාරම් ලේඛනය සමඟ සැසඳීමේදී රු. 84.297 ක වෙනසක්ද. බදු කුලී අත්තිකාරම්. උපලේඛනය සමඟ සැසඳීමේදී රු. 640,000 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

2.2.3 ආ (i)

2.2.3 (ආ) (iv)

2.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

පහත එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගනුදෙනු සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

ගිණුම් විෂය	වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
	රු.	
ඉඩම්	676,169,345	ඉඩම් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන/ උපලේඛන
ලිපි ද්‍රව්‍ය තොග	3,182,913	විස්තරාත්මක උප ලේඛන
වන්දි අවිනිශ්චිත ගිණුම්	222,444,438	

2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 වර්ෂයේ සිට විවිධ ණයගැතියන්ගෙන් අයවිය යුතු රු. 2,311,017 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදීද එසේම පැවතුණු අතර එම වටිනාකම තහවුරු කිරීමට අදාල මූලාශ්‍ර ලියවිලි සභාව සතුව නොතිබුණි.

(ආ) වර්ෂ 1 ½ සිට වර්ෂ 07 කට අධික කාල පරාසයක් තුළ සේවය හැරගිය / වැඩ තහනම් කළ සේවකයින් 48 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු.745,785 ක් විය.

(ඇ) වසර 5 සිට වසර 10 කට අධික කාල පරාසයක් තුළ වූ ඉඩම් විකුණුම් අත්තිකාරම් රු.11,302.992 ක්ද, වසර 11 කට අධික කාලයක සිට ගෙවිය යුතුව පවතින රු. 11,230,850 ක බදු කුලී අත්තිකාරම්ද නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ඈ) ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් වලින් රු. 181,500 ක් වසර 7 සිට වසර 11 කට වැඩි කාලයක සිට පැවත එන බැව් දක්නට ලැබුණි. තවද, වෙළඳ හා අනෙකුත් ගෙවීම් යටතේ විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ගෙවිය යුතු ලෙස දැක්වෙන රු. 800,130 ක වටිනාකමක් වසර 11 කට අධික කාලයක් නිස්සේ පැවතුනු අතර ඒවා පියවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වන්දි අවිනිශ්චිත අදියර II ගිණුමෙන් 2005 වර්ෂයේ සිට වසර 12 ක් පුරා වන්දි නිරවුල් කිරීමක් සිදු වී නොතිබුණු අතර එම අවල ශේෂය රු. 109,959,493 ක් විය.

(ඊ) රාජ්‍ය ආයතන හා සංස්ථා මණ්ඩල වෙතින් දීර්ඝ කාලයක සිට බදු මුදල් අයවී නොතිබුණු අතර විගණනයට වාර්තා වී ඇති ආයතන දෙකකින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු බදු මුදල රු. 10,258,731 ක් විය. එසේම අනෙකුත් රාජ්‍ය ආයතන විසින් අයවිය යුතු බදු මුදල් පිළිබඳව විගණනයට වාර්තා කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත.	කොමිෂන් සභාව එකතු කළ අගය මත බදු පනත යටතේ ලියාපදිංචි වී නොතිබුණි.
(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය.	රාජ්‍ය ව්‍යවසායයන්, අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද එසේ අනුමැතිය ලබානොගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රු.1,369,328,834 ක් ආයෝජනය කර තිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 757	වත්කම් අයිතම 6 කට අදාලව එකතුව රු.115.505.336 කට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(ඈ) 2011 අගෝස්තු 25 දිනැති අංක 11/ විවිධ (015-1) දරන අමාත්‍ය මණ්ඩල තීරණය	රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය ආයතන විසින් ඉඩම් බැහැර කිරීමේදී අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද, කලුගල් සඳහා ඉඩම් බදු දීමේ ක්‍රියාවලියේදී එසේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඉ)	2002 මැයි 23 දිනැති අංක 2002/11 දරන පාලන චක්‍රලේඛයේ 05 වගන්තිය.	ඉඩම් බදුදීමේදී කොමිෂන් සභා තීරණ ලබා ගැනීමෙන් අනතුරුව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කෙරෙන අතර අනුමැතිය ලබාගෙන මැනුම් නියෝග නිකුත් කළයුතු වුවිද එයට පටහැනිව මැනුම් කටයුතු අවසන් කරගෙන වසර 05 ක මුදල්ද අයකිරීමෙන් අනතුරුව අමාත්‍යවරයාගේ අනුමැතියට යවා තිබුණි.
(ඊ)	2008 අප්‍රේල් 17 දිනැති අංක 2008/ පොදු/ 1 දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ 1(i) සහ (ii) වගන්තිය	අදාල වර්ෂය සඳහා හිඟ පරිහරණ ගාස්තු එම වසර තුළදීම අයකර අවසන් කළ යුතු බවත් හිඟ පරිහරණ ගාස්තු නොපමාව අයකළ යුතු බවත් දැක්වුවද වසර ගණනාවක පරිහරණ ගාස්තු අයකර නොතිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

අක්කර 5 ට වැඩි කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මොණරකැලේ වත්තෙන් අක්කර 280 ක් පෞද්ගලික සමාගමකට වර්ෂ 2011 දී තිස් අවුරුද්දකට බදු දී තිබුණි. සමාගමෙන් අය විය යුතු රු. 10,764,622 ක බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.120,442,701 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.55,708,450 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.64,734,251 ක වර්ධනයක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී පසුගිය වර්ෂයේ ලැබිය යුතු බදු කුලී ආදායම මෙම වර්ෂයේදී ගිණුම්ගත කිරීමෙන් බදු කුලී ආදායම රු. 61,376,383 කින් වැඩිවීමද, වෙනත් මෙහෙයුම් ආදායම් එනම් ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම් රු.42,446,909 කින් වැඩිවීමද මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවති අතර 2012 වර්ෂයෙන් පසුව ක්‍රමයෙන් අතිරික්තය අඩු වී 2016 වර්ෂයේදී නැවතත් ප්‍රමාණවත් වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. පසුගිය වර්ෂ 4 ක කොමිෂන් සභාවේ දායකත්වය පිළිබඳ ඇගයීමේදී පෙර වර්ෂයන්ට සාපේක්ෂව පිළිවෙලින් 2013 වර්ෂයේ රු. 12,728,112 ක පිරිහීමක්ද, 2014 වර්ෂයේදී රු. 14,994,085 ක වර්ධනයක්ද, 2015 වර්ෂයේ රු. 14,829,018 ක පිරිහීමක්ද, 2016 වර්ෂයේදී රු. 95,018,964 ක වර්ධනයක්ද දක්නට ලැබුණි.

3.2 කොමිෂන් සභාවට එරෙහිව හෝ කොමිෂන් සභාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

2016 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවට එරෙහිව හා කොමිෂන් සභාව විසින් පවරා ඇති නඩු සංඛ්‍යාව 562 ක් ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී කොමිෂන් සභාවට එරෙහිව පවරා ඇති නඩු සංඛ්‍යාව 68 ක් වූ අතර, කොමිෂන් සභාව විසින් පවරා තිබූ නඩු සංඛ්‍යාව 22 ක් ද වූ අතර, අධිකරණ තීන්දු ලබාදුන් නඩු සංඛ්‍යාව 35 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 2 වගන්තිය ප්‍රකාරව යම් තැනැත්තකුට අයිති උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම්, එම තැනැත්තන් අයිතිව තබා නොගැනීම, සුරක්ෂිත කිරීම, පවරා ගැනීම හා ඒ ඉඩම්වල නිෂ්පාදනය සහ ඒ ඉඩම් වලින් ඇතිවන රැකී රක්ෂා ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලය දෙන ක්‍රමයකට ඒවා ප්‍රයෝජනයට ගැනීම කොමිෂන් සභාවේ මූලික අරමුණ වේ. කොමිෂන් සභාවේ අරමුණු ඉටුකිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබාදීම

(i) 1972-1974 අතර කාලසීමාවේදී ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබූ ඉඩම් වලට අදාලව මේ දක්වාත් එනම් වර්ෂ 40 ක් ඉක්මවාද ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබා නොදුන් පුද්ගල සංඛ්‍යාව 235 ක් විය. මින් සියයට 25 ක් 25 පිඹුරු ඉදිරිපත් නොකිරීම මතද, සියයට 53 ක් ප්‍රකාශකයින් ඉදිරිපත් නොවීම මතද ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබාදීමට නොහැකි වී තිබුණි.

(ii) පිඹුරු ඉදිරිපත් කිරීම, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ මැදිහත්වීමෙන් අදාල ප්‍රකාශක ලවා ඉටුකරවා ගතයුතු වුවද වර්ෂ 40 කට අධික කාලයක් තුල පිඹුරු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) මෙසේ ව්‍යවස්ථාපිත නිශ්චයන් ප්‍රමාද වුවද ඉඩම්වල භුක්තිය ප්‍රකාශක වෙත තිබීම තුළ කොමිෂන් සභාවට පවරා ගන්නා ලද මෙම ඉඩම් ප්‍රයෝජනවත් ලෙස භාවිතා කිරීමට සහ ආදායම් උපයාගැනීමට පවතින ඉඩකඩද සීමාවී තිබුණි.

(ආ) වන්දි ගෙවීම

(i) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වන වගන්තිය යටතේ වන්දි ගෙවීමට අදාල ගැසට් නිවේදන පල කරන ලද හිමිකම් තහවුරු නොවූ ලිපිගොනු 104 ක් වර්ෂය ආරම්භයේදී පැවතුනු අතර ඉන් 2016 වර්ෂයේදී වන්දි ගෙවීමට හැකිව තිබුණේ 3 ක් සඳහා පමණි.

(ii) පනතේ 33 වගන්තිය ප්‍රකාරව හිමිකම් තහවුරු වී ඇති යම් තැනැත්තෙකුට ගෙවිය යුතු යම් වන්දියක් ඔහු විසින් පිලිනොගන්නා ලද අවස්ථාවක හෝ, තැනැත්තා මිය ගොස් ඇති විට හෝ, ඔහු ගැන දැනගැනීමට නොහැකි අවස්ථාවක ඒ වන්දිය එය හිමි තැනැත්තා විසින් ලබා ගැනීමට හැකි පරිදි සිවිල් අධිකරණ බලය ඇති අධිකරණයක තැන්පත් කළ යුතු වුවද ලිපිගොනු 127 කට අදාලව මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ඉටුකිරීමේ ප්‍රගතිය

(i) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ උපරිම සීමාව ඉක්මවා ගිය ඉඩම් හෙළිදරව් කරගැනීම, කොමිෂම වෙත පැවරී ඇති ඉඩම් ලියාපදිංචි කිරීම හා හිමිකම් හා ලේඛන ලියාපදිංචි කිරීම, ඉඩම් විෂයය පිලිබඳව විධායක නිලධාරින්ට සහ ක්ෂේත්‍ර නිලධාරින්ට පුහුණු වැඩසටහන් පැවැත්වීම, විශේෂිත තනතුරු සඳහා පරිගණක පුහුණුව ලබාදීම, විධිමත් කාර්යසාධන ක්‍රියාවලියක් ආරම්භ කිරීම, ලේඛන සංරක්ෂණය කිරීම සහ විධිමත් ලේඛනාගාරයක් ස්ථාපිත කිරීම, අනවශ්‍ය ලිපිගොනු අපහරනය කිරීම, ලේඛනාගාරයේ ඇති ලිපිගොනු පරිගණකගත කිරීම යනාදී ක්‍රියාකාරකම් කිසිසේත් ඉටුකර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව දක්වා තිබූ ක්‍රියාකාරකම් 16 ක ඉලක්කයන්ගෙන් සියයට 50 කට අඩු ප්‍රගතියක් අත්කරගෙන තිබුණි.

(iii) සමස්තයක් ලෙස ගත් විට ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන්ගෙන් සියයට 50 ක් හෝ ඊට අධිකයක් ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 35 ක් තරම් වූ පහළ මට්ටමක පැවතුණි.

4.2. කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඇබර්ෆොයිල් වත්ත ඉඩමෙන් පර්චස් 20 ක් සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා 2014 වර්ෂයේදී වසර 30 ක කාලයක් සඳහා බදු දීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද ඒ වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල සහ තක්සේරු හා සේවා ගාස්තුව වූ රු. 2,707,711 ක මුදල විගණන වාර්තාවේ දිනය දක්වාම ගෙවීම් සිදු කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති ඉඩම් බදුදීමට අදාල නිශ්චිත ක්‍රියාපරිපාටිය දැක්වෙන ලිඛිත මහපෙන්වීමක් කොමිෂන් සභාව විසින් සකස් කර නොතිබුණි.

(ඇ) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව අක්කර 50 ට වැඩි ඉඩම් සභාව වෙත පවරා ගැනීමෙන් පසුව ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබාදීමේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ කු/121 ප්‍රකාශකට අයත් අක්කර 89 පර්චස් 27 ක් සභාවට පවරාගෙන තිබුණි. එම පැවරුමට අදාල ව්‍යවස්ථාපිත නිශ්චය ලබාදීම වසර 40 කට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ඈ) කො/2962 දරන ප්‍රකාශකට අයත් අක්කර 175 පර්චස් 36.66 ක ප්‍රමාණයක් 1975 සහ 1981 වර්ෂ වලදී කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර තිබුණි. ඒ සඳහා වූ ව්‍යවස්ථාපිත නිශ්චයන් වශයෙන් හුවමාරු ඉඩම් රත්නපුර, කැගල්ල සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් අක්කර 50 ක් ද ලබා දීමට කැබිනට් ස්ථාවර කමිටුවේ අනුමැතිය ලබා ගෙන තිබුණද එයින් අක්කර 40 ක් පමණක් නිදහස් කර තිබුණි.

(ඉ) කුරුණෑගල වැවිලි සමාගම මඟින් පාලනය කළ දනවිකන්ද වත්ත ඉඩමෙන් අක්කර 05 ක ප්‍රමාණයක් 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1)(ආ) වගන්තය යටතේ පුද්ගලයකුට බදු දී තිබූ අතර ඒ සඳහා කළුගල් කැඩීමට කුරුණෑගල වැවිලි සමාගමේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි. තවද බදු ගනු ලැබූ පුද්ගලයා ඉදිරිපත් කර තිබූ තොරතුරු සාවද්‍ය විය.

(ඊ) කොමිෂන් සභාවේ පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම සඳහා රු. 6,591,676 ක් දරා තිබුණු අතර 2016 ජූලි 29 දින වැඩ නිම කර තිබුණි. එසේ වුවද විගණිත දිනය වූ 2017 මාර්තු 23 දින වන විටත් කාර්යාල කටයුතු ආරම්භ කර නොතිබුණි.

4.3. මෙහෙයුම් ක්‍රියාකාරකම්

තෝරාගැටියවත්ත ඉඩමේ ව්‍යවස්ථාපිත නිශ්චය වශයෙන් අක්කර 50 ක ප්‍රමාණයක් ප්‍රකාශකට නැවත පවරා දී තිබුණ ද මායිම් නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් ප්‍රකාශක විසින් අමතර අක්කර 108 ක් ද භුක්ති විඳ තිබුණි. නීතියට පටහැනිව අමතර භුක්ති විඳින අක්කර 108 හි භුක්තිය ලබා ගැනීමට හෝ බදු දීමට හෝ කටයුතු නොකිරීමෙන් කොමිෂන් සභාවට අලාභයක් සිදු වී තිබුණි.

4.4. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි අක්කර 593 ක් වූ මැද්දෙගෙදරවත්ත ඉඩමෙන් පුද්ගලයන් 6 දෙනෙකුට එකතුව අක්කර 319 ක් අමාත්‍ය මණ්ඩල තීරණයක් නොමැතිව 2016 වර්ෂයේදී බදු දී තිබූ අතර එහිදී රජයේ තක්සේරුවක් රහිතව දළ තක්සේරුව වූ රු. 4,546,000 ක මුදලකට බදු දී තිබුණි.

(ආ) පෙතියකන්ද වත්තෙන් අක්කර 100 ක ප්‍රමාණයක් 30 අවුරුදු බදු පදනමට 2004 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත භාරදී තිබුණු අතර එය 2004 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් තහනම් කර තිබුණි. තවද මෙම පැවරීම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණ අතර භාවිතයේ පවතින ඉඩම් පැවරීමේ ක්‍රමවේදයද අනුගමනය කිරීමෙන් තොරව රු. 100,000 ක බදු කුලී අත්තිකාරම් මුදලක් පමණක් ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් එවා ඇති

සභාපතිවරයාගේ පිළිතුර අනුව 2017 මාර්තු 20 දින බදුකරු භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය ඔහුට නැවත පැවරීමට සභාපතිවරයා තීරණය කර තිබුණි.

(ඇ) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇත්හොඩගල නින්දගම නැමැති ඉඩමෙන් අක්කර 49 රූඩ් 03 පර්චස් 30 ක ප්‍රමාණය පෞද්ගලික සමාගමකට රු. 100,000 ක බදු අත්තිකාරමක් ලබා ගැනීමෙන් 2003 අගෝස්තු 22 දින දී භුක්තිය භාරදී තිබුණි. 2016 අගෝස්තු 21 වන දිනට හිඟ බදු මුදල හා සියයට 10 ක අධිභාරයද සමඟ රු. 2,527,224 ක් අයවිය යුතු වුවද සමාගම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම හිඟ බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ නිකපොත මුතුවානවත්ත නමැති ඉඩමෙන් අක්කර 98 ක ප්‍රමාණයක් පෞද්ගලික සමාගමක් වෙත 2004 වර්ෂයේදී වසර 30 කාලයක් සඳහා බදු දී තිබුණි. මෙම පැවරීම අවිධිමත් පැවරීමක් වන බැවින්, 2004 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් එය අවලංගු කර තිබුණි. කෙසේ වුවද අමාත්‍ය මණ්ඩල තීරණය නොසලකා මෙම ඉඩම 30 අවුරුදු කාලයකට එම සමාගමට බදු පදනමට ලබාදීමට 2008 අගෝස්තු 26 දිනදී කොමිෂන් සභා තීරණයක් ගෙන තිබුණි. තවද, අක්කර 100 කට ආසන්න මෙම ඉඩමෙන් සභාවට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(ආ) 1985 වර්ෂයේදී අම්බලමානවත්ත ඉඩමෙන් අක්කර 05 ක ප්‍රමාණයක් සිදු තිරුවානා ගල් ව්‍යාපෘතියක් සඳහා පුද්ගලික සමාගමක් වෙත විකිණීමෙන් පවරා දී තිබුණු අතර මෙම පැවරීමද 2004 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අවලංගු කර තිබුණි. තවද 2002 වර්ෂයේ සිට මේ දක්වා සමාගම විසින් සිලිකා කැඩීම සිදු කරනු ලබන බැවින් ඒ සඳහා නීතිමය පියවර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. එසේම ඉන් කොමිෂන් සභාවට විශාල ආදායමක් ලබාගැනීම ද අහිමි වී තිබුණි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පිලගොඩවැලි වතුයායෙන් අක්කර 660 ක ප්‍රමාණයක් 2004 පෙබරවාරි 27 දින කොම්පෝස්ට් පොහොර නිපදවීමේ ව්‍යාපෘතියක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත බදු දී තිබුණි. මෙම බදු දීම ද 2004 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල නිරණය මගින් තහනම් කර තිබුණි. එසේම එම සමාගම විසින් කොම්පෝස්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් බැහැරව වෙනත් කටයුත්තක් වෙනුවෙන් යොදවා තිබුණි. නැවත එම ඉඩම් පවරා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබූ අතර විගණිත දිනය දක්වා කිසිදු බදු මුදලක් අයකර නොතිබුණි.

(ඈ) ගම්පහ දිස්ත්‍රික්කයේ බටගොල්ල, රෑනගල යන ඉඩම් වලින් අක්කර 48 ක් පුද්ගලික සමාගමක් වෙත 2004 වර්ෂයේදී බදු දීමේදී මූලික තක්සේරුව ලෙස රු. 224,000 ක බදු මුදලක් නියම කර තිබුණු අතර, වර්ෂ 5 න් 5 ට රජයේ තක්සේරුව ලබාගෙන බදු සංශෝධනය කිරීමට නියමිත වුවත්, 2016 දෙසැම්බර් 31 දින වන විට වසර 12 ක් ගත වී ඇති බැවින් බදු සංශෝධන 2 ක් තක්සේරු කළ යුතු වුවත් එසේ කර නොතිබුණු අතර සියයට 50 ක වටිනාකමක් එකතු කර තාවකාලික බදු සංශෝධනයක් සිදු කර බදු අය කර තිබුණි.

4.6. කාර්ය මණ්ඩල පරිපාලනය

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 45(1)(ආ) වගන්තියට පටහැනිව ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2015 පෙබරවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා පත් කර තිබුණි. තවද ඔහුගේ කාර්ය පැවරුම් යටතට කොමිෂන් සභාවේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා වාර්ෂික අයවැය හා වාර්ෂික වැඩ සටහනක් ප්‍රධාන කාර්ය සාධක දර්ශක සමඟ සකස් කළ යුතු වුවද එම කටයුතු ඉටු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1. අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කළ විගණන විමසුම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) අභ්‍යන්තර විගණන සැලැස්මේ දක්වා තිබූ අංශයන් ආවරනය කෙරෙන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණු අතර 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5)(ඩී) වගන්තිය ප්‍රකාර අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.2. ප්‍රසම්පාදන සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන ප්‍රකාරව රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.

5.3. අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ තථ්‍ය හා අයවැයගත ආදායම් හා වියදම් පරීක්ෂාවේදී ආදායම් විෂයයන් 02 කට අදාලව සියයට 39 සිට සියයට 53 දක්වා සහ වියදම් විෂයයන් 16 කට අදාලව සියයට 38 සිට 167 දක්වා වූ පරාසයක සැලකිය යුතු විචලනයන් අනාවරනය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

5.4. විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක PED 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අඩු තරමින් වර්ෂයකට විගණන කමිටු රැස්වීම් 4 ක් වත් පැවැත්විය යුතු වුවද 2016 වර්ෂයේදී රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිගණක මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීම සඳහා 2002 වර්ෂයේ ගෙවා තිබුණු රු. 17,000,000 ක මුදලක් වසර 15 ක් තිස්සේ පරිගණක අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණු නමුත්, මෙම සටහන නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට විගණිත දිනය වූ 2017 මාර්තු 25 දින වන විටත් නොහැකි වී තිබුණි.

(ආ) වර්ෂ 11 කට අධික කාලයක සිට පැවතුණ රාජ්ය ආයතන 8 කින් අයවිය යුතු රු.2,135,625,366 ක මුදල සමාලෝචිත වර්ෂයේදීද එසේම පැවතුණු අතර, ඒ සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ග ගැනීමට මෙම වර්ෂයේදීද අසමත් වී තිබුණි. 2016 මාර්තු 23 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත සපයා තිබූ පිළිතුර ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්, සභාපති සහ භාණ්ඩාගාරයේ මැදිහත් වීම මත සියලුම පාර්ශවයන් කැඳවා තීරණයක් ලබා ගත යුතු බවට දක්වා තිබුණද මේ දක්වාත් තීරණයක් ගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් වූ අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	ගිණුම්කරණය	(i) හිඟ ආදායම් පිළිබඳ වාර්තා යාවත්කාලීන නොවීම (ii) ආදායම් අංශය, ඉඩම් පැවරීම අංශය, ව්‍යාපෘතිය අංශය ඇතුළු අනෙකුත් සියළුම සම්බන්ධිත පාර්ශව ගිණුම් අංශය සමඟ සම්බන්ධීකරණයන් නොවීම.
(ආ)	ණයගැනි පාලනය	(i) ඇතැම් රාජ්‍ය ආයතන වෙතින් සභාවට අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් අදාල අංශ වෙතින් දැනුම් නොදීම හේතුවෙන් ගිණුම්ගත කිරීමට නොහැකි වීම. (ii) අයවිය යුතු බදු මුදල් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබීම. (iii) ණයගැනි ශේෂ සනාතන ලබාගෙන නොතිබීම.

(ඇ)	ව්‍යාපෘති සඳහා ඉඩම් බදුදීම	(i) ව්‍යාපෘතින් සඳහා ඉඩම් බදු දීමේදී බදු කරුවන් තෝරා ගැනීමේ ක්‍රමවේදයක් නොතිබීම. (ii) කිසියම් ව්‍යාපෘතියක්, ව්‍යාපෘතියක් වන බවට අදාල කරගතයුතු නිශ්චිත නිර්නායක කවරේද යන්න සහ එම නිර්නායක ඇගයීමෙන් ව්‍යාපෘතියක් වනවාද නැත්ද යන්න සලකා බැලීමක් සිදුකිරීමක් සහාව විසින් මේ දක්වාත් සිදුකර නොතිබීම.
(ඈ)	ආදායම් එකතු කිරීම	(i) දිස්ත්‍රික් බල මණ්ඩල විසින් එක් එක් කාර්යාල වලින් එක් එක් වර්ග වලට අදාලව අයවිය යුතු විවිධ ආදායම් විස්තරාත්මකව ලේඛනගත නොකිරීම. (ii) හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු නොකිරීම.
(ඉ)	ගබඩා පාලනය	(i) තොග ලේඛන යාවත්කලීනව නඩත්තු නොකිරීම. (ii) වාර්ෂික තොග සමීක්ෂණය සිදුකර නොතිබීම. (iii)ගබඩා පරිශ්‍රය ක්‍රමවත්ව නඩත්තු නොකිරීම.

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති